

# ‘නව පරපුරකට අලුත් චින්තනයක්’ කොටුගොඩ නා හිමිට

අලුත් දිශානතියක් සඳහා දර්ශනයක් ගොඩනැගීමේ අරමුණින් මිලින්ද මොරගොඩ මහතා සකස් කළ ‘නව පරපුරකට අලුත් චින්තනයක් උදෙසා න්‍යාය පත්‍රයක්’ නිර්දේශපාලනික ප්‍රතිපත්ති යෝජනා මාලාව කෘතියක් වශයෙන් නිකුත් කෙරිණි.

පසුගිය වසරේ ඔක්තෝම්බර් මාසයේදී මෙහි කෙටුම්පත ප්‍රකාශයට පත් කළ අතර ගිහි පැවිදි විද්වතුන් සහ පොදු ජනතාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලැබුණ විවිධ අදහස් අනුව එහි අවසන් පිටපත සකස් කර ඇත.

නව පරපුරකට අලුත් චින්තනයක් උදෙසා න්‍යාය පත්‍රය කෘතියේ පිටපතක් අග්ගමහා පණ්ඩිත කොඩුගොඩ ධම්මාවාස ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ මහා නාහිමිපාණන්ට පිරිනැමුන අවස්ථාවයි මේ.

උරුමයක උල්පත් පදනමේ සභාපති ලලිත් වීරතුංග, මහලේකම් ආර්.ඒ.ඩී. සිරිසේන යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.